රුහුණ විශ්වවිද්‍යාලය

**2018/2019 අධ්‍යයන වර්ෂය**

**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය**

**පළමු සමාසික පරීක්ෂණය - 2019 ඔක්තෝබර්**

**ECN 21653- මුදල් බැංකු හා මූල්‍ය**

ප්‍රශ්න <u>හතරකට</u> <u>**(04)**</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය : පැය 03 යි.**

---

1. (i). ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ප්‍රධන අංග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) මූල්‍ය වෙළෙඳපොළයන්හි ප්‍රධන ආර්ථික කාර්යයන් (Major economic function) මොනවා ද? (ලකුණු 04)

(iii) මුදල් වෙළෙඳපොළ සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අතර වෙනස දක්වන්න. ඒවා එකිනෙක සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 04)

(iv) එහි විවිධ පැතිකඩ මත පදනම්ව ඔබ මූල්‍ය වෙළෙඳපොළ වර්ගීකරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 03)

2. (i) මූල්‍ය වත්කම්වල ප්‍රධාන ආර්ථික කාර්යයන් සහ මූලික ගුණාංග (Key Properties) පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) අක්‍රමවත් අවදානම (Unsystematic risk) යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? අක්‍රමවත් අවදානමට හේතු කාරණාඋදාහරණ ඇසුරින් සපයන්න. (ලකුණු 05)

(iii) මූල්‍ය වත්කම් හා මූර්ත වත්කම් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) මූල්‍ය වත්කමක මුදල් ප්‍රවාහය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 02)

3. (i) ද්‍රවශීලතා අවදානම (liquidity risk) සහ පැහැර හැරීමේ අවදානම (Default risk) ය
විස්තර කරන්න. (ලකුණු 04)

(ii) අරමුදල් ණයට දීම සහ ණයගැනීම සම්බන්ධව පිළිවෙලින් අතිරික්ත ඒකක හ
ඒකකවල වෙනස් අරමුණු ලේඛනගත කරන්න. (ලකුණු 03)

(iii) යම් ආර්ථිකයක් විෂයෙහි මූල්‍ය අතරමැදියන් පවතින්නේ ඇයි? (ලකුණු 04)

(iv) පොලී අනුපාතික පහළ හෙළීමට උපකාරී වීමේ දී මූල්‍ය අතරමැදියන්ගේ කාර්යභාර
වැදගත්කම සාකච්ඡා කරන්න. පිළිතුර පැහැදිලි කිරීම සඳහා රූප සටහනක් භාවිතා කර
(ලකුණු 04)

4. (i) මුදල් නිර්වචනයට අදාල විවිධ ප්‍රවේශ දක්වන්න. සාම්ප්‍රදායික මුදල් නිර්වචනය
චිකාගෝ මුදල් නිර්වචනය අතර මූලික වෙනස්කම් මොනවා ද? (ලකුණු 05)

(ii) මුදල් ගුණකය තීරණය කරන නිශ්චායක මොනවා ද? මුදල් තැන්පතු අනුප
(Currency-Deposit ratio) ඉහළ ගිය විට එය මුදල් ගුණකයට බලපාන්නේ කෙසේ ද?
(ලකුණු 05)

(iii) 2018 වර්ෂයේ ශ්‍රී ලංකා ආර්ථිකයට අදාලව කල්පිත මූල්‍ය දත්ත පහත ලේඛනය ම
සැපයේ

| | අයිතමය | රුපියල් බිලියන |
|---|---|---|
| 1. | සමස්ථ ව්‍යවහාර මුදල් | 250.00 |
| 2. | වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 50.00 |
| 3. | මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු | 100.00 |
| 4. | මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු | 20.00 |
| 5. | පටු මුදල් සැපයුම ($M_1$) | 360.00 |
| 6. | වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු | 1500.00 |
| 7. | දේශීය තැන්පතු වගකීම් ලෙස සලකනු ලබන අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් | 300.00 |
| 8. | විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි නේවාසික තැන්පතු | 150.00 |
| 9. | මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් | 350.00 |

පහත ඒවා ගණනය කරන්න

(අ). සංචිත මුදල් වටිනාකම

(ආ). මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්

(ඉ). වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු

(ඊ). ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)

(උ). පුළුල් මුදල් සැපයුම් ගුණකය ($mmM_2$) (ලකුණු 05)

5. (i) යම් ආර්ථිකයක පොලී අනුපාතිකය, ආයෝජන, මිල මට්ටම සහ ආදායම යන විචල්‍යයන් මත ලිහිල් මුල්‍ය ප්‍රතිපත්තියක බලපෑම ප්‍රස්ථාරිකව පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑත වර්ෂ වලදී මුල්‍ය ප්‍රතිපත්ති රාමුව නවීකරණය කිරීමට ගනු ලැබ ඇති පියවර මොනවා ද? (ලකුණු 08)

6. (i) විනිමය සමීකරණය (Equation of exchange) පැහැදිලිව දක්වන්න. එහි න්‍යායාත්මක වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) කේන්ස්ට අනුව මුදල් ශේෂ ලගතබා ගැනීමට පදනම් වන චේතනා මොනවා ද? (ලකුණු 05)

(iii) "සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම ප්‍රවර්තන පොලී අනුපාතිකයේ ශ්‍රිතයකි". යෝග්‍ය රූප සටහන් පදනම්ව ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ලකුණු 05)

(iv) ද්‍රවශීලතා පාශය (liquidity trap) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

7. පහත සඳහන් ඒවායින් ඕනෑම **තුනක් (3) ක්** පිළිබඳ විස්තරාත්මක සටහන් ලියන්න.

i. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS)
ii. කේන්සියානු න්‍යායේ මුල්‍ය සමතුලිතය
iii. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු
iv. කොටස් වෙළෙඳපොළෙහි කාර්යභාර්ය
v. මුල්‍ය වෙළෙඳපොළේ තොරතුරු අසමානතාවය (ලකුණු 15)

@@@@@@@@@@